

# හලන්න හදන 13 වැනි යකා සහ නටන තොවිලේ ඇත්ත

ඔක්තොබර් මස 24 වන දින කොළඹ පදනම් ආයතන්යේ පැවති "ව්‍යවස්ථාවෙන් රට බෙදන්න ඉඩ නොදෙන සටන අරඹනුපොදු සමුළුව" අමතමින් එහි ප්‍රධාන දේශනය කළ ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී ජන රජයේ ඉදිකිරීම් ඉංජිනේරු සේවා නිවාස සහ පොදු පහසුකම් අමාත්‍ය විමල් වීරවංශ ප්‍රකාශ කරන ලද්දේ, 13 වන ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝදනය මගින් රට බේදීයාමේ අණාතුරට රට මුහුණ දෙමින් තිබෙන බැවින් සියළු වාද භේද අතහැර දේශමාමක සියළු දෙනා එකම හඬින් කියා සිටිය යුත්තේ මෙම සංශෝදනය අහෝසි කළ යුතු බව යි.

මෙම බල වේගය ගොඩ නැගීමට අමාත්‍ය චම්පික රණවක ඇතුළු හෙල උරුමයද අමාත්‍ය දිනේශ් ගුණවර්ධන ඇතුළු මහජන එකසත් පෙරමුණද තමන් සමග එකගතවය පල කර ඇතැයි කී ඇමති වරයා අනෙකුත් දේශපාලන පක්ෂවලට ද තමන් හා එක්වන මෙන් ආරාධනා කළ අතර විශේෂයෙන් 13 වන සංශෝධනයට විරුද්ධ යැයි තදින් හඬ නගන ජ. වි. පේ . තමන්ගේ අවංකභාවය ඔප්පු කළ යුතු යැයි ද ප්‍රකාශ කර සිටියේ ය. ඔහුගේ මූලික ප්‍රකාශයේ ඇති යටි අරමුණු සම්බන්ධව විමසා බැලීම පසුවට කෙරෙන බැවින් මුලින්ම මෙම ප්‍රකාශය හා මෙම ඇමති තුන් කට්ටුවේ පරස්පර විරෝධී පැවැත්ම විමසා බැලීම වටී

13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් රට බෙදෙනවා යැයි මර ලතෝනි දෙන මෙම ඇමතිවරු තිදෙනාම, ප්‍රථමමයෙන් පාර්ලිමේන්තු මංත්‍රීවරුන් වශයෙන් ද , දෙවනුව ඇමති වරු වශයෙන් ද දිවුරුම් දී පොරොන්දු වූයේ මේ 13 වන සංශෝදනය ද අඩංගු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂා කරන බවටත් එයට අනුකූලව කටයුතු කරන බවටත් ය

ඔවුන් විසින්ම ආරක්ෂා කිරීමට දිවුරා පොරොන්දු වූ ආණ්ඩුක්‍රම ව්‍යවශ්තාව රට බෙදීමට ඉවහල් වන්නේ නම් එයින් අදහස් කරනු යේ මෙම රජ තුන් කට්ටුව ද රට බෙදීමට ව්‍යවස්ථාව හරහා දිවුරා පොරොන්දු වී ඇති බව ය .

ශ්‍රී ලංකාවේ දෙමළ පීඩිත ජාතියේ ප්‍රශ්නයට විසඳුමක් වශයෙන් ආසියාතික කලාපයේ බලවතෙකු ද ශ්‍රීලංකාවේ කිට්ටිටුම අසල්වැසියා වන ඉංදියාවේ බල කිරීම මත 1987 දී පැවති කලාපීය සහ ගෝලීය යතාර්තයට අනුරූපීව ක්‍රියාත්මක කෙළ 13 වන සංශෝදනය, එදා ශ්‍රීලංකා රාජ්‍යට හා කලාපීය දේශපාලනයට තද බල තෙරපුමක් ඇති කළ පීඩිත දෙමළ ජාතියේ සංනද්ධ ප්‍රකාශණාය වූ එල්. ටී. ටී ඊ ය සන්නධමය වශයෙන් තලා පොඩිකර දමා දෙමළ ජාතිය තම උපන් භූමිය තුලම එළිමහන් සිරකරුවන් බවට පත්කර වසර තුනක් ඉක්මවා යන මේ මොහොතේ ඔවුන් හට විසඳුමක් වශයෙන් ගෙනා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාතා සංශෝදනය ඉවත් කිරීමට බෙරිහන් දීම, එය ඉවත් කරගැනීමට වඩා ඔබ්බෙන් වූ උවමනාවක් මේ නිශ්චිත මොහොතේ දී ඉටු කරන බව නිරීක්ෂණය කිරීමේ දී හොඳින් පෙනී යයි.

## අයවැයේ ආශ්චර්යය

දෙදහස් දහතුනේ අයවැය පිළිබඳව මෑත දී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ විසර්ජන පනත් කෙටුම් පතින් රාජ්‍ය වියදම් සඳහා වෙන් කර ඇති මුළු මුදලින් 45% වඩා වැඩී වු ප්‍රමාණයක් ජනාධිපති රාජපක්ෂ සහ ඔහුගේ පවුල් සංස්ථාව අතර බෙදාගෙන ඇත. එය රටේ ජනතාව අතර ප්‍රසිද්ධ කතිකාවක් බවට පත් වීම වැලැක්වීම ද විශ්ව විද්‍යාල ආචාරවරුන්ගේ ද, විදුහල්පති හා ගුරුවරුන්ගේ ද, විශ්ව විද්‍යාල ශිෂ්‍යයන්ගේ ද, දොස්තරවරුන් හා සමස්ථ පීඩිත ජනතාවන්ගේම, අයවැය පිළිබඳව එල්ල විය හැකි විරෝධයෙන් ගැලවීමට රාජ්‍යයට මේ මොහොතේ කුමක් හෝ ආවරණයක් අවශ්‍ය ය. ඒ සඳහා ලබා ගත හැකි හොඳම ආවරණයක් නම්, ජාති මාමකත්වය තුලින් ජාතිවාදය නැවත මුදුනටම ගෙන ඒම බව හොඳින් දන්නා රජය එහි වගකීම එවැනි ක්‍රියාවන් සඳහා ගිනස් පොතට ඇතුල් වීමට තරම් වටිනා වාර්තා තබා ඇති විමල් චම්පික හා හැට පැන්නත් වඳුරා බිමින් නො යන බවට කදිමට ඔප්පුකරමින් සිටින දිනේශ් වෙත, එම වගකීම පවරා ඇති අතර, එය ඔවුන් රජය බලාපොරොත්තු වනවාටත් වඩා වැඩි වේගයකින් රට තුල ගොඩ නගමින් සිටී.

දෙසැම්බර් මාසයේ අය වැය පැමිණිමත්, ලබන වසරේ මාර්තු මාසයේ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසමේ රැස්වීමත්, එක ළඟ පැමිණිම තම වාසියට හරවා ගන්නා රජය රට බෙදීමට ජාතිකවත් ජාත්‍යන්තරවත් කුමණ්ත්‍රණ ඇතැ යි යන ගින්න අවුළුවා, සිංහල පීඩිත ජනයාගේ විරෝධය තමන් වෙත එල්ල වීම වළක්වා ගැනීම දැන් වසර ගණනාවක් තිස්සේ නිදහ සේ කරගෙන එමින් සිටී.

## ජාත්‍යන්තර දේශපාලනයට ගොඩයන් එකතු වීම

කල්ලියක් විසින් රටක් පාලනය කරන විට, දුර දක්නා නුවනක්, ප්‍රජාතන්ත්‍රවාදී භාවිතාවන්, ජනතාවගේ ඕනෑ එපාකම් හෝ රටක ගරුත්වය පිළිබඳව හෝ උවමනාවක් කැක්කුමක් ඇති වීම ස්වභාවික නොවනු ඇති බව, රජපක්ෂ පාලනයෙන් පෙන්නුම් කරන යථාර්තයකි. එම පසුබිම තුල දහතුන් වැනි සංශෝදනය අහෝසි කිරීම යන සටන් පාඨය හිටි හැටියේම කරලියට ගෙන එමේ උපායික හා සැඟවුණු හේතු සාධක ගෝලීය දේශපාලනික තත්ත්වයන් තුල තේරුම් ගන්නේ කෙසේ ද.

රජිව් * ජයවර්ධන ගිවිසුම හරහා ව්‍යවස්ථා ගත වූ සම්මුතියට හා ජාතීන්ගේ ප්‍රශ්නය සම්බන්ධයෙන් දිය හැකි යැයි විශ්වාස කරන්නා වූ විසඳුමට හා එය ක්‍රියාවට නැංවීමට බල කරන ජාත්‍යන්තරයට චණ්ඩි පාට් දැමීමට තරම් හේතුවක්, හයියක් හා හැකියාවක් නිර්මාණය වීමේ ඇත්ත විය හැක්කේ කුමක් ද. මේ පිළි බඳ ජාත්‍යන්තර චලනයන් විය හැකි සාධකයන් ලෙස, ඉන්දියාව, චීනය, අමෙරිකාව හා එක්සත් ජාතීන්ගේ සංවිධානය හා සෙසු බලවත් රාජ්‍යන් ලෙස සලකා බැලූවහොත්, එම චලනයන් ප්‍රෙයෝජනයට ගනිමින් රාජපක්ෂ කල්ලි පාලනය තම පිරිහෙමින් පවතින අනාගතය ශක්තිමත් කර ගැනීම උදෙසා, ජාත්‍යන්තර දේශපාලනය පිළිබඳ තම සුවච උපදේශකයන් විසින් දෙන ලද න්‍යාය පත්‍රයක් ගෝඨාභය රාජපක්ෂත්, ඔහුගේ නියෝගයෙන් විමල් ඇතුලූ ග්‍රාමීය දේශපාලකයන් විසින් ක්‍රියාවට නංවන්නක් බව බුද්ධිමත්ව කල්පනා කිරීමේ දී අවබෝධ වනු ඇත.

බහුතර බලයකින් ශක්ති සම්පන්න වී සිටින්නේ යැයි ද, බලය බෙදීම සඳහා වූ යෝජනාවලියට බහුතරයේ විරෝධය ඇති බව මවා පාමින් , තමා වටා ඉන්දියාවට කැරකීමට සැලැස්වීමත්, ඉන්දියාව ඇති කරන පීඩනයේ වාසිය චීනය යොදාගෙන ඉන්දියාව හා චීනය අතර ඇති වන බල අරගයෙන් බොරදියේ මාළු බෑමමට සිතන උපදෙස් යොදා ගෙන ජාතිවාදය නැවත වටයකින් උලුප්පාලමින් පැන නගින ජනතා ප්‍රශ්න යටපත් කිරීමටත් සිතනවා විය හැකිය. අමෙරිකාව විසින් ගෙන එන ලද ජිනීවාහිදී සම්මත වූ යෝජනාව හා ඒ සම්බන්ධ කාරණයන් එළඹෙන එක්සත් ජාතීන්ගේ සැසිවලදී එතරම් මහ හඬකින් බලපැම් කිරීමට තරම් අවශ්‍යතාවයක අමරිකාව පසුවන්නේ නැති බව සිතමින්, ඕවුන්ගේ පදයට නැටීමට දැනටමත් පටන් ගෙන ඇති නිසා, දෙමළ ජනයාගේ ප්‍රශ්නය විසඳීම ඔවුන්ට ඓන්ද්‍රිය ප්‍රශ්නයක් නොවන නමුත් එය උපායික කරණයක් බව හොඳින්ම පැහැදිලි වන්නේය. ප්‍රශ්නය වන්නේ කල්ලියක පැවැත්මට පීඩිත ජාතියකට මහා විනිශයක්න් පසුව ද ගොදුරු බවට පත් විමටත්, එයම දඩමීමා කරගනිමින්, රට සෑම සියලූ ආකාරයෙන්ම විනාශයට ලක්කොට, දකුණේ ජනයා ද එහි ගොදුරක් කරගැනීම ය.

## ස්තුතියි



විටිල්සී නගර සභාවේ සවුත් වෙස්ට් කොට්ඨාශය සඳහා තරග වැදුණ අපේක්ෂකයන් 15 දෙනකු අතරින් 8 වන ස්ථානය ලබා ගන්නට මට සහය දැක් වූ ඔබ සැමට මගේ ප්‍රණාමය පුද කරන්නට පළමුව කැමැත්තමි. සති තුනක පමණ කාලයකදී ලබා ගත් මෙම ප්‍රතිඵලය අප ලද ජයග්‍රහණයක් ලෙස මම සිතමි.

මෙවර නගර සභාවට තේරී පත්වන්නට අපට නොහැකි වුව ද මේ මැතිවණ ව්‍යාපාරය තුළින් අප ලද දැනුම අත්දැකීම් හා පන්නරය ඉදිරියේදී ප්‍රයෝජනවත් වනු ඇති බව නිසැකය. මෙහිදී අප ලබා ගත් අත්දැකීම් හා අපේ නිරීක්ෂණ ඉදිරියේදී මාධ්‍ය මගින් ඉදිරිපත් කරන්නට මම බලාපොරොත්තුවෙමි. එය අපේ ප්‍රජාවට වැදගත් වනු ඇතැයි මම සිතමි.

ඔබේ සහය නොවන්නට මගේ මැතිවරණ ව්‍යාපාරය මේ ආකාරයෙන් දියත් කරන්නට මට නොහැකි වනු ඇත. මේ වෙහෙසකර කාර්යයේ දී විවිධාකාරයෙන් සහය දැක්වූ සහ මා ධෛර්යමත් කළ ඔබ සැම පිලිබඳ මගේ කෘතවේදීත්වය නැවත පුද කරමි. මගේ ප්‍රජා සේවාව තව දුරටත් ඉදිරියට ගෙන යන්නට මේ පන්නරය ලබා දුන් ඔබ සැමට ස්තුතියි.

හිමාලි කරුණාසේන